රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2018.07.17

## ප්‍රවෘත්ති නිවේදනයයි

***සුවසැරිය දෙවන පියවර යාපනය මහ නගරසභා ක්‍රීඩාංගනයේදී ආරම්භ කෙරේ***

සුවසැරිය ගිලන් රථ සේවාවේ දෙවන පියවරේ සමාරම්භක උළෙල ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2018 ජූලි මස 21 වන දින යාපනය මහ නගරසභා ක්‍රීඩාංගනයේදී ආරම්භ කෙරේ. ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝඩි මැතිතුමා ද රූපවාහිනී තාක්ෂණය ඔස්සේ ඉන්දියාවේ සිට සජීවීව මෙම උළෙල ඇමතීමට නියමිතය.

දෙවන පියවර ආරම්භ කිරීම සඳහා ඉන්දීය රජය මගින් ඇමරිකන් ඩොලර් මිලියන 15.02 ක් ලබාදී ඇති අතර, ඒ යටතේ නව ගිලන් රථ ඒකක 209කට අධික ප්‍රමාණයක් යෙදවීමට නියමිතය. ඒ සඳහා ශ්‍රී ලාංකික තරුණයින් 1782 ක් පමණ පුහුණුකර සේවයේ යෙදවීමට ද සැලසුම් කර තිබේ.

පරිපූර්ණ, කඩිනම්, විශ්වාසනීය සහ ගුණාත්මක පූර්ව රෝහල් ප්‍රතිකාර සේවා ලබාදීම මගින් ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම පිණිස පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන්රථ සේවාවන් අත්‍යවශ්‍ය සේවාවක් වශයෙන් රජය විසින් හඳුනාගෙන ඇති අතර, 2018 අංක 18 දරණ සුවසැරිය පදනම පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද්දේ ද මෙම අරමුණෙනි.

1990 අංකයට ලැබෙන දුරකථන ඇමතුමක් මත ක්‍රියාත්මක වන මෙම සේවාව හොඳින් පුහුණු වූ වෛද්‍ය තාක්ෂණික නිලධාරියකු සහිත ගිලන් රථයක් මගින් ළඟම රෝහල වෙත රෝගියා ප්‍රවාහනය කරන අතරතුර පූර්ව රෝහල් සත්කාර ද සිදු කරනු ලැබේ.

පළමු අදියර බස්නාහිර හා දකුණු පලාත්වල දිස්ත්‍රික්ක 6ක් පාදක කරගෙන ආරම්භ කර ඇති අතර වෛද්‍ය තාක්ෂණික ශිල්පීන් සහිත ගිලන් රථ 88ක් සේවයේ යොදවා ඇත. මේ සඳහා ඩොලර් මිලියන 7.55ක් ඉන්දීය රජය විසින් ප්‍රදානය කරන ලදී.

පළමු අදියර යටතේ සේවකයින් 800ක් යොදවා ඇති අතර දෛනිකව ප්‍රතිකාර ලැබූ රෝගීන් සංඛ්‍යාව 175ක් පමණ වේ. මේ වන විට රෝගීන් 79000කට අධික ප්‍රමාණයක් රෝහල් කර ඇති අතර ගිලන් රථ තුළ උපත ලබා ඇති බිළිඳුන් ප්‍රමාණය 27කි.

**නිහිඟු සුදර්ශන ගුණවර්ධන**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**


163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.

දු.ථො t (+94 11) 2515759
ෆැ.பெ f (+94 11) 2514753
ඊ.மி e infodept@slt.lk

www.news.lk